# කොළඹ මහා නගර සභාව

# පුරප්පාඩු දැන්වීම

## කොළඹ මහා නගර සභාවේ ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත

## විදුලි / යාන්ත්‍රික / සිවිල් තාක්ෂණ නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම

කොළඹ මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට විදුලි / යාන්ත්‍රික / සිවිල් තාක්ෂණික නිලධාරීන් ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත ලබාගැනීමට අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි තනතුරු නාමය සඳහන් කර 2022-12-30 දිනට ප්‍රථම නාගරික ලේකම්, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ - 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර බඳවා ගැනීම කඩිනම් කිරීම පිණිස අයදුම්පත් පහත සඳහන් විද්‍යුත් තැපැල මගින්ද යොමු කළ යුතුය.

medpt@colombo.mc.gov.lk

1. තනතුර : විදුලි / යාන්ත්‍රික / සිවිල් තාක්ෂණික නිලධාරීන් (ශ්‍රම මිලදී ගැනීමේ පදනම)
2. වැටුප් ප්‍රමාණය : දිනකට රු 2,900.00 බැගින් (උපරිම 30X2,900= 87,000/-)
3. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
4. වෘත්තීය සුදුසුකම්
   - (i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව හෝ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම.

     හෝ
   - (ii) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව.

     හෝ
   - (iii) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

     හෝ
   - (iv) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 හෝ ඉහළ මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

     හෝ
   - (v) ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

     හෝ
   - (vi) රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ විදුලි / යාන්ත්‍රික / සිවිල් තාක්ෂණික සේවයේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරියෙක් / නිලධාරිණියක වීම. (2022-12-31 දිනට වයස අවුරුදු 65 ට අඩු විය යුතුය.)
5. වෙනත් සුදුසුකම් :
   - (i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
   - (ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
6. බඳවා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත්ව සේවය බඳවාගනු ලැබේ.
   1. සම්මුඛ පරීක්ෂණයකින් පසු තෝරා ගැනීම සිදු කෙරේ.
   2. දිනකට අවම පැය 08 ක කාලයක් (දිවා / රාත්‍රී) සේවයේ යෙදිය යුතුය.
   3. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.
   4. රාජකාරී ඉටු කරන එක් දිනකට රු. 2,900.00 බැගින් වැඩකරන මසකට (දින 30) සෙනසුරාද, ඉරිදා හා රජයේ නිවාඩු දින ද ඇතුළත්ව එක් අයෙකුට රු. 87,000.00 බැගින් උපරිම ගෙවීම් කරනු ලැබේ.
   5. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාද, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල ඉහත දීමනාවට යටත්ව සේවය කිරීමට සිදුවේ.

www.colombo.mc.gov.lk මගින් අයදුම්පත බාගත කරගත හැක.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අදාළ සේවා ලබාගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

**ජේ.එම්. භද්‍රානි ජයවර්ධන,**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව,**
**පුරහල, කොළඹ 07.**